# අග්‍රාමාත්‍ය කාර්යාලය
# பிரதம அமைச்சரின் அலுவலகம்
# PRIME MINISTER'S OFFICE

අග්‍රාමාත්‍ය මාධ්‍ය අංශය - අරලියගහ මන්දිරය, කොළඹ 03.
பிரதமர் ஊடக பிரிவு - அலரிமாளிகை, கொழும்பு 03.
Prime Minister's Media Division - Temple Trees, Colombo 03.
දුරකථන | தொலைப்பேசி இலக்கம் | Telephone } 011 4354731
ෆැක්ස් | தொலைநகல் | Fax } 011 2473838
විද්‍යුත් තැපැල | மின்னஞ்சல் | E-mail } news@pmoffice.gov.lk


මාධ්‍ය නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE

**මාධ්‍ය නිවේදන අංක - 414**
**2021.05.24**

**සීමිත වාහන සංඛ්‍යාවක් හෝ ආනයනය කිරීම අත්හිටුවීමට කැබිනට් අනුමැතිය හිමිවෙයි**

සීමිත වාහන සංඛ්‍යාවක් හෝ ආනයනය කිරීම රටේ වත්මන් තත්ත්වය සැළකිල්ලට ගනිමින් අත්හිටුවීමට ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අද (24) දින රැස්වූ කැබිනට් මණ්ඩලය තීන්දු කර ඇත.

අමාත්‍ය මණ්ඩල හමුව අද දින අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් සූම් තාක්ෂණයෙන් රැස්වූ අවස්ථාවේ අමාත්‍ය මණ්ඩලය මෙම තීරණය ගෙන තිබේ.

වර්තමානයේ රටේ පවතින තත්ත්වය සහ මූල්‍ය ස්ථාවරය පිළිබඳ අවධානය යොමු කර මින් වාහන ගෙන්වීම තවදුරටත් සීමා කළ යුතුව ඇතැයි කැබිනට් මණ්ඩලයට අමාත්‍යවරුන් පෙන්වා දී ඇත.

ඒ අනුව සීමිත වාහන සංඛ්‍යාවක් හෝ ආනයනය කිරීමට මෙයට පෙර පැවති යෝජනාව කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව තවදුරටත් අත්හිටුවීමට පියවර ගෙන තිබේ.

Rohan Welivita

**රොහාන් වැලිවිට,**
**අග්‍රාමාත්‍ය මාධ්‍ය ලේකම්.**
**0774054198**